# කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ප්‍රකාශිත ගොවි සතිය
## නිමිත්තෙන් පවත්වන ගොවි සම්මන්ත්‍රණය

**කෘ**ෂිකර්ම අමාත්‍යාංශය මගින් "අපි වවමු රට නගමු." තේමාව යටතේ ක්‍රියාවට නංවා ඇති දේශීය ආහාර නිෂ්පාදනය හා පරිභෝජනය දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම යටතේ මෙම 01 දින සිට 05 දින දක්වා ප්‍රකාශයට පත් කොට ඇති ජාතික ගොවි සතිය සහ කෘෂිකර්ම ප්‍රදර්ශනය මෙරට කෘෂිකර්මය සම්බන්ධ සියලු ම ආයතන ඒකරාශී කොටගත් අවස්ථාවක් වනු ඇත.

"තරුණ ගොවි දිනයයි - ඉසුරුබර හෙට දවසයි" තේමාව යටතේ පැවැත්වෙන මෙම ගොවි සතිය අරමුණු කිහිපයකින් යුක්ත ය. එනම්, ගොවි ප්‍රජාව දේශයේ උන්නතියට කළ මෙහෙය ඇගයීම, ශ්‍රී ලාංකික තරුණ තරුණියන් හට කෘෂිකර්මය ආකර්ෂණීය වෘත්තියක් බවට හඳුන්වා දී සේවා වියුක්තියට එයින් විසඳුම් සෙවීම, විද්‍යාත්මක කෘෂිකර්මය, යාන්ත්‍රික කෘෂිකර්මය, කෘෂි ව්‍යාපාර, අගය එකතු කිරීම, පශු අස්වනු තාක්ෂණය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සහ දේශීය ආහාර නිෂ්පාදනය හා පරිභෝජනය දිරිගැන්වීමේ වැඩසටහන තවදුරටත් සක්‍රිය කිරීම හා මහින්ද චින්තනය ඉදිරි දැක්ම අනුව දේශීය කෘෂිකාර්මික අංශය සවිබල ගැන්වීම යි.

මේ සෑම අරමුණක ම අවසන් බලාපොරොත්තු වනුයේ, සමෘද්ධිමත් ගොවි ජනතාවක් බිහි කිරීම හා ගොවීන් ජාතික කෘෂිකාර්මික සංවර්ධන ක්‍රියාවලියේ ඵලදායී කොටස්කරුවන් බවට පත් කිරීම යි.

සංවර්ධන වැඩසටහන්වල සාර්ථකත්වය මූලික ව රැඳී පවතිනුයේ මානව සම්පත් නිසි ලෙස භාවිතය හා කළමනාකරණය කිරීම තුළ ය. එසේ වුව ද ලාංකීය කෘෂිකාර්මික සමාජය තුළ මෙම සම්පත් නිසි ලෙස භාවිතය හා කළමනාකරණය කරනවා ද යන්න පිළිබඳ විවිධ මතවාදයන් බිහි වී ඇත. විශේෂයෙන් ගොවීන් තුළ පවතින සාම්ප්‍රදායික සිතුම් පැතුම්, ආකල්ප ධනාත්මක ලෙස වර්ධනය නො වීම, කෘෂිකාර්මික සම්පත් හා ඒවා භාවිතය පිළිබඳ අනවබෝධය, සංනිවේදන දුර්වලතා, නායකත්වය පිළිබඳ ගැටළු මෙන් ම ජනතා සහභාගිත්වයේ පවතින දුර්වලතා සංවර්ධන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට බාධකයක්ව පවතී.

"මහින්ද චින්තන ඉදිරි දැක්ම" තුළින් අපේක්ෂිත ප්‍රතිඵල කරා රට ගෙන යාමට මෙන් ම කෘෂිකාර්මික සංවර්ධනයේ නිසි ඵල ළගා කර ගැනීමටත් හැකි වනුයේ මෙම ක්‍රියාවලියට සෘජුවම දායක වන ගොවි ජනතාවගේ ශක්තිය පුබුදුවා ලීම තුළ ය. එසේත් නැති නම් ජාතික කෘෂිකාර්මික සංවර්ධනයට අවශ්‍ය පරිදි මෙම පිරිසේ කුසලතා හා ශිල්පීය ඥානය වර්ධනය කිරීම තුළ ය.

මෙම කාර්ය සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලාංකික ගොවි ජනතාව තුළ කෘෂිකර්මාන්තයේ ඇති වැදගත්කම, කෘෂිකර්මාන්තය මුහුණ දෙන ගැටළු. අභියෝග සහ අනාගත ප්‍රවණතාවයන් මෙන්ම ගොවි සංවිධානවල වැදගත්කම හා එහි කාර්යභාරය පිළිබඳ ව දැනුම, අවබෝධය වර්ධනය කළ යුතු අතර දේශයේ අඛණ්ඩ සංවර්ධනය උදෙසා ඔවුන්ගේ හැකියාව පුළුල් කළ යුතු ව ඇත.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතන මෙම ජාතික අවශ්‍යතාවය සපුරාලීම සඳහා මෙවර ජාතික ගොවි සතිය නිමිති කොටගෙන මෙහෙයවන වැඩසටහන් අතර ගොවි සම්මන්ත්‍රණය සුවිශේෂී අංගයකි. එය මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය විසින් සම්බන්ධීකරණය කෙරේ.

### ගොවි සම්මන්ත්‍රණයේ අරමුණු

මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන අරමුණු වනුයේ දේශීය ආහාර නිෂ්පාදනය හා පරිභෝජනය දිරිගැන්වීමේ වැඩසටහන සක්‍රිය ලෙස ඉටු කිරීමට, කෘෂිකාර්මික සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන පාර්ශ්වකරුවෙකු ලෙස ගොවි ප්‍රජාවේ දැනුම, ආකල්ප, හා කුශලතා වර්ධනය කිරීම යි.

### විශේෂිත අරමුණු

1. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ගැටළු, අභියෝග හා අනාගත ප්‍රවණතා පිළිබඳ දැනුම හා අවබෝධය වැඩිදියුණු කිරීම.
2.. ගොවි සංවිධාන හා එහි කාර්යභාරය පිළිබඳ දැනුම හා අවබෝධය පුළුල් කිරීම.
3. ගොවිජන ගැටළු, අභියෝග හා අනාගත ප්‍රවණතා හඳුනා ගැනීම සහ එමගින් පර්යේෂණ හා පුහුණු අවස්ථා හඳුනා ගැනීම.

| | | |
|---|---|---|
| **දිනය** | : | 2010 සැප්තැම්බර් මස 01 දින සිට 05 දින දක්වා |
| **ස්ථානය** | : | නෙවොල්පිටිය ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය |
| **සහභාගී වන්නන්** | : | හම්බන්තොට දිස්ත්‍රික්කයේ සහ මාතර දිස්ත්‍රික්කයේ ගොවි නායකයන් 850 දෙනෙකි. සම්මන්ත්‍රණ 13 කින් යුක්ත වේ. |

ජාතික කෘෂිකාර්මික ක්‍රියාවලිය අඛණ්ඩව ගෙන යා හැකි හැකියාවන් හා කුසලතාවයන්ගෙන් යුත් ගොවි ජනතාවක් බිහි කිරීමත්, කෘෂිකාර්මික ක්ෂේත්‍රය මුහුණ දෙන ගැටළු හා අභියෝග හඳුනා ගැනීම තුළින් සමාජ-ආර්ථික පර්යේෂණ ඉඩප්‍රස්ථා හා පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමත් මෙම සම්මේලනය ඔස්සේ අවසන් වශයෙන් කටයුතු කරනු ඇත. කෘෂිකාර්මික නවෝදයක් උදෙසා යන ගමනක අප ආයතනයේ මෙහෙවර සජීවී එකක් කිරීම සමස්ත වැඩසටහන මගින් අපේක්ෂා කොට ඇත.


ආචාර්ය එම්.එස්. සේනානායක
එන්.එස්.බී. ඇපාකන්ද
එස්.එම්.ඒ. සමරකෝන්
පර්යේෂණ නිලධාරීන්
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය